16 වන පිටෙන්

සංඛපාල රජුගේ මියගිය ලෙච්චවී රැජිනට ප්‍රණාමය දක්වමින් ඇරඹෙන තොවිලයේ දෙවන යාමය, දළුමුර පාලිය, කලස් පාලිය, දූපා පාලිය, මුගුරු පාලිය, සළු පාලිය, මඩු පාලිය, කෙණ්ඩිපාලිය වැනි පෙළ පාලියකි. මේ නර්තනයන් හි විලාශය මෙන්ම ඇඳුම, වෙස් මුහුණ, අංග විලාශය සහ අතැති ආයුද හෝ අංගයන් ද එකිනෙකට වෙනස් වේ. මුගුරු පාලියේ අතැත්තේ මුගුරකි. දූපා පාලියේ ධූඹ නැතිහොත් දුම් බඳුනකි.

භූත, අභූත, අමුක්කු, වැදි, කණ, ගොළු, බිහිරි, වාත, පිත, සෙලෙස්මා, කොර, මූර්තු, ගුල්ම, නාග, දෙමළ, ජල, දේව, කෝල යන සන්නි දහඅට සහාගතවීමේදී ද ඒ ඒ රෝගවලට අදාළ අංග ලක්ෂණ යකැදුරන් විසින් රඟ දක්වනුයේ නාට්‍ය රංගන ශිල්පීන්ගේ ප්‍රතිභාව දක්වමනි. පද පෙරලිය සමඟින් දෙපැත්ත කැපෙන කතා බහද ඊට එක්වේ. රෝගවලට අදාළ ලකෂණ ඒ ඒ වෙස් මුහුණින්ද දැක්වෙන්නේය. කට්ටඩි මහතුන් සය දෙනෙකුගෙන් එකුන් විස්සක් වූ චරිත රඟ දැක්වීමේදී සංවාද මගින් තම තමාව හඳුන්වා දීමක්ද සිදුවේ. ප්‍රාදේශීය යක්ෂ සංකල්පයන්ද මීට අමතරව ඉදිරිපත් කිරීමයි හපන්කම.

සැබැවින්ම ශාන්ත කර්ම සාහිත්‍යයක් ඇත්තේය. ලිච්චවී රජ පෙළපත එයින් බිහිවූ සංඛපාල රජ, ඉහත කී උපන් කතා හා සන්නියකුන් විශාලා නුවරට කළ විනාශය අවසන බුදුරජාණන් වහන්සේගේ උපදෙස් අනුව ආනන්ද මහ රහතන් වහන්සේ එහි වැඩම කර පිරිත් පැන් ඉසීම දක්වා වූ මේ සාහිත්‍ය කාව්‍ය බවටත් ගායනා බවටත්, ඉන් අනතුරුව රංගනයන්, නර්තනයක්, කලාවක් මතු නොව ඇදහිල්ලක් දක්වා විකාශය වීමයි, අපූර්වත්වය වන්නේ. රඟමඩල ''සංඛපාල වීදිය'' හෝ ''කන්‍යා වීදිය'' නම් වේ. සන්නි පිදේණිය තබන්නේ පොළවෙහි සිට වූ මෝල් ගසක් මත පොල් කටුවක් තබා ඒ මත්තෙහිය. එනයින් පිදේනිය මෝල්ගහ මත්තෙහි කැරකවීමට හැකි වීම සන්නි පිදේනියේ විශේෂත්වයයි.

*සන්නි දහඅටම නියෝජනය වන සේ මුහුණු දහඅටම ඇතුළත්ව නිර්මාණය වූ වෙනමම වෙස් මුහුණක් මේ සඳහා පළඳිනු ලැබේ. මෙහිදී ලංකාවට ඇතුළු වන්නට නොදී කඩවත් අල්ලා ගෙන සිටිනුයේ සමන්, නාථ, පත්තිනි වැනි දෙවිවරුන් ය.*

''මේවා දවසකින් දෙකකින් නිර්මාණය වුණ දේවල් නොවේ. කාලාන්තරයක් තිස්සේ එක එක රෝග ලක්ෂණ හඳුනා ගෙන ඒ දේවල් තමයි මේ අංගවලට ඇතුළත් කෙරිලා තියෙන්නේ. පැහැදිලිවම මේ හැම දෙයක්ම කෙරෙන්නේ ආතුරයා වෙනුවෙන්. එක් එක් සන්නිය ගැන අපි ගායනයෙන්, රඟපෑමෙන්, වෙස්මූණින් විස්තර කරන්නේ ආතුරයාට, ආතුරයාට මේ දේවල් තේරුණොත් විතරයි.

එයාගේ අසනීප මානසිකත්වය නැති කරන්න පුළුවන් වෙන්නේ'' සේදරමන් ගුරුන්නාන්සේ තමන්ගේ අත්දැකීමෙන් අත්දුටු දේ විස්තර කළ හැටි පන්ට සිහි වුණා. මේ දේවල් දැක්කම ආතුරයාට ඉබේම වැටහෙනවා තමුන්ට තියෙන රෝගය. අන්තිමට සන්නි යකුන් ඒ රෝග දුරුවන් වෙන්න සෙත් පැතුවම ආතුරයගේ හිතට හොඳයි. පද පෙරළලා කියලා විහිලු තහලු කිරීමෙන් ආතුරයාගේ මානසික ආතතිය අඩු කිරීමත් වෙනවා. රෝගය යකෙක් විදියට සලකලා බයෙන් ඉන්න ආතුරයාගේ, ඒ බව යකැදුරන් අඩු කරන්නේ භයංකර, රළු ගති පෙන්නා ගෙන එන යකුන් තමන්ගේ අණසක යටතට ගන්න එකෙන්.''

''ඒ ඒ ශාන්ති කර්මවලට ආවේණික විවිධ පැතිකඩවල් තියෙනවා. වෙද මහත්තයෙක් ලෙඩා එන හැටි දුර තියාම දැකලා ලෙඩේ තීරණය කරලා බෙහෙත් නියම කරනවා, වගේ යකැදුරා ආතුරයාගේ හැසිරීම් ලකෂණ බලලා මේ මේ ශාන්ති කර්ම කළොත් හොඳාය කියලා, තීරණය කරනවා. දේපා ලක්ෂණ බලලා ඒ තීරණය ගන්න දැකපුරුද්ද, පළපුරුද්ද, කළ පුරුද්ද, අභ පුරුද්ද සහ පෙර පුරුද්ද (ගිය ආත්මවල පුරුදු) කියන පුරුදු පහ බලපානවා. මේ දේවල් තමන්ගේ ගුරුන්ගෙනුත් යකැදුරු මහත්තයාට ලැබෙනවා.''

''එක පාරටම තොවිලයක් වගේ දෙයක් කරන්න අමාරුයිනේ. ඉතින් යකැදුරා ලෙඩාට ඇපනූලක් ගැට ගහලා තමන් ඇප වෙනවා යම්කිසි කාලසීමාවක් ඇතුළත ශාන්ති කර්මයක් කරන බවට. ඒ භාරය ඉෂ්ඨ කර දෙනකල් ආතුරයාව ආරක්ෂා කර ගන්නට ඉල්ලීමක් කරන්නේ ඇඳුරායි. ඊට පස්සේ කතා කරගෙන, හිතවත් නෑයින්ට ආරාධනා කරලා ඒ අයගෙන් ඇප උපකාර අරගෙන අන්තිමට ශාන්ති කර්මය කෙරෙන්නේ සාමුහික දෙයක් විදියට. සේදරමන් ගුරුන්නාන්සේට බෙන්තරගේ ආචාර්යතුමාත් විටින් විට එක්වුණා.

අවසන් වශයෙන් සහාගත වන මහා කෝල සන්නිය සඳහා වෙනමම රංගනයක් අභිනව කෙරෙන්නේය. මහා කෝල සන්නියෙන් කෙරෙනුයේ මේ සියළුම සන්නි නියෝජනය කරමින් ලංකාව තරණය කිරීමකි.

සන්නි දහඅටම නියෝජනය වන සේ මුහුණු දහඅටම ඇතුළත්ව නිර්මාණය වූ වෙනමම වෙස් මුහුණක් මේ සඳහා පළඳිනු ලැබේ. මෙහිදී ලංකාවට ඇතුළු වන්නට නොදී කඩවතත් අල්ලා ගෙන සිටිනුයේ සමන්, නාථ, පත්තිනි වැනි දෙවිවරුන් විසිනි. නොයෙකුත් උපක්‍රම මගින් කඩවන භාර ගැනීමට නොහැකි වන කෝල සන්නියට ජේතවනාරාමයට ආපසු ගොස් බුදුරජාණන් වහන්සේගෙන් සන්නසක් ගෙන ඒමට සිදුවේ. ඒ අනුවය කඩවත හැරෙනුයේ. සන්නසක වටිනාකම එයයි. නොයෙකුත් රූපයෙ-න් ආතුරයා වෙත එන අතුරු ආන්තරාවන් ඔහු හෝ ඇය රකින්නන්ට පැහැදිලි කර දී අවශ්‍ය දේ ළඟා කර දීමයි සන්නසක වැදගත්කම.

අපගේ ''සන්නස'' දරණ ප්‍රධාන වගකීමද එයයි. පාඨකයා අපගේ ආතුරයා වන්නේය. ආතුරයාට ඇති ''උණ'' වන්නේ තමන්ගේ දේ පිළිබඳව තමන්ගේ අය පිළිබඳව තමන්ගේ ප්‍රවෘත්ති හා වගතුග දැන ගැනීඹට ඇති උනන්දුවයි. එය නොලද කල්හි පාඨකයා තමන්ගේම අතීතයක තනිවී තමන්ගේම මතකයන් හි එල්බ ගෙන ඒ මනෝභාවයන් මත මනඃකල්පිතයන් මවා ගන්නේය.'' පන් ලිව්වා. පින් හබරන කැලේට යන්න ඇත්තෙත් ඒ හන්දා වෙන්න ඇති.

''යමක් කිරීමේදී ඒ කා වෙනුවෙන් ද යන්න වැදගති. ශාන්ති කර්ම කෙරෙනුයේ ආතුරයාට මෙන්ම ලිවිය යුත්තේ පාඨකයාටයි. ගැයිය, වැයිය යුතුව ඇත්තේ රසිකයාටයි. නැටිය, රැගිය, යුත්තේ ප්‍රේක්ෂකයාටයි. ඔවුනට ගෝචර නොවන, දෙයින් ඇති ඵලය කිම? ඔවුන් අයැදින දේ ම ලබාදීම මින් අදහස් නොකෙරේ. ඔවුන් රුචි දේ වඩාත් හරවත් ලෙසින් ලබාදීමෙන් ඔවුන් වඩාත් උසස් තලයකට නැංවීමේ හැකියාව මාධ්‍යයන්ට තිබිය යුතු යැයි හැඟේ.'' පන් තමන්ගේ මනෝමය ලියවිල්ල හමාර කළා.

මේ සාකච්ඡාව සම්බන්ධීකරණය කළ ස්කැටිස් සංවිධානයේ මාලනී ජයසිංහ සහ ශ්‍රී ලංකාවේ සංස්කෘතික අමාත්‍යාංශයේ අතිරේක ලේකම් රේණුකා ඒකනායක මහත්මීන්ට ස්තුති කරන්නට පන් අමතක කරන්නේ නෑ.

සිසිර දිසානායක




STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්

- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....

ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න

මුද්‍රණ ඇණවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත

LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243

